// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2251/59 – 2021 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා – 2021.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/13/02/2009.
IR/13/23/2009.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

අංක 2214/10 දරන හා 2021.02.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් දෙල්ඔලුව, ඉලුක්තැන්න හි පදිංචි ඩබ්. ජී. විමල් රූපසිංහ මයා. සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3420 දරන හා 2020.10.15 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3420 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2022.02.08 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ජූලි මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.
2021.04.05

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2021.02.08 දිනැති අංක 2214/10 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, ඩබ්. පී. විමල් රූපසිංහ සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2020.10.15 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙමි.

නීතිඥ රුවිරානි ජයකොඩි,
ප්‍රධාන නීති නිලධාරි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කරුළ පාර,
කොළඹ 05.

*පිටපත -*

ඩබ්. ජී. විමල් රූපසිංහ, ඉලුක්තැන්න, දෙල්මලුව.

11 – 230

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.